# 'නාගාලන්තයේ ජනකතා' කෘතියෙන් හෙළිවන නාගාලන්තයේ ජන ජීවිතය පිළිබඳ අධ්‍යයනයක්

*කුමාරි, එස්. ජී. ජී. එම්.* [1]

ජනකතා යනු ඕනෑම ජන සමාජයක සංස්කෘතියක දක්නට ඇති ජනශ්‍රැති අංග අතර ප්‍රධාන තැනක් උසුලන්නකි. මිනිසා භාෂාව භාවිත කිරීම ආරම්භ කළ යුගයේ සිට ඔහු ජීවත් වූ පරිසරයේ ඔහු අත්විඳි නානාවිධ අත්දැකීම්, ජීවන වෘත්තීන්, ආහාර-පාන, ඇඳුම්-පැළඳුම් පිළිබඳ නිර්ව්‍යාජ තොරතුරු ස්පර්ශ කරමින් නිර්මාණය වී ඇති හෙයින් ජනකතාව ගැමි දිවියේ තථ්‍ය පිළිබිඹුවක් ලෙස සැලකේ. ඊසානදිග ඉන්දියාවේ නාගාලෑන්ඩ් නම් ප්‍රාන්තයේ කඳුකර ගෝත්‍රික ජනයාගේ ජනකතා සාහිත්‍යයෙන් බිඳක් '**නාගාලන්තයේ ජනකතා**' නමැති හින්දී බසින් සිංහල බසට පරිවර්තිත කෘතියේ අන්තර්ගතය. එය මධුරුප් වාචස්පති නම් ලේඛකයා විසින් හින්දී බසින් රචනා කරන ලද '**නාගාලෑන්ඩ් කී ලෝක්කථාඒ**' නමැති ජනකතා සංග්‍රහයේ එන කතාවල සිංහල පරිවර්තනයයි. '**නාගාලන්තයේ ජනකතා**' කෘතියෙන් හෙළිවන තත්කාලීන නාගාලන්ත ජන ජීවිතය කෙබඳු වේදැයි යන්න අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණ අරමුණ වේ. පර්යේෂණ සීමාව වශයෙන් '**නාගාලන්තයේ ජනකතා**' නමැති කෘතිය කේන්ද්‍ර කරගනිමින් අනෙකුත් භාරතීය ජනකතා සංග්‍රහ දෙසද අවධානය යොමු කරමින් භාරතීය ජන ජීවිතය අධ්‍යයනය කිරීමට අපේක්ෂිතය. පර්යේෂණ අරමුණ හා සබැඳි ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය මෙහි පර්යේෂණ ක්‍රමවේදය වේ. '**නාගාලන්තයේ ජනකතා**' කෘතියෙහි අන්තර්ගත ජනකතා අට මගින් තත්කාලීන නාගාලන්ත ජනයාගේ සංස්කෘතියට අයත් ජීවන වෘත්තීන්, ආහාර-පාන, භාවිත කරන ලද විනිමය මාධ්‍යයන්, විනෝද වීම උදෙසා අනුගමනය කරන්නට යෙදුණු විනෝදාස්වාද මාර්ග පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය. ඒ අනුව තත්කාලීන නාගාලන්ත ජන දිවියේ අංශ ගණනාවක් පිළිබඳ යම් අවබෝධයක් '**නාගාලන්තයේ ජනකතා**' කෘතිය අධ්‍යයනය කිරීමෙන් ලබාගත හැකි බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පදඃ ජනකතා, නාගාලෑන්ඩ් කී ලෝක්කථාඒ, නාගාලන්තයේ ජනකතා, භාරතීය ජන දිවිය, භෞතික සංස්කෘතිය

[1]*ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*madhusha2831@gmail.com*